එකම වරදක් සඳහා කාන්තා සහ පිරිමි දෙපාර්ශවයම සහභාගී වූ විටකදී පවා, කාන්තාව පමණක් ඉස්මතු කිරීම ඇතැම් මාධ්‍ය මගින් සිදුකරයි.

එසේ කරන මාධ්‍ය අපට හැඟවීමට තැත් කරන්නේ, ස්ත්‍රී පුරුෂ දෙපාර්ශවයම සහභාගී වී සිදු වන වරදකදී වුවද, එම වරද සම්බන්ධයෙන් කාන්තාවට වඩා වැඩි වගකීමක් පැවරෙන බව දැයි පාඨක අප ඇසිය යුතු වේ.

කූට ලේඛන සකස් කිරීමේ ස්ථානයක් වැටලීමේ සිදුවීමක් පිළිබඳව, සිංහල සහ දමිළ භාෂා පුවත් වාර්තාවන් (ජූනි 03, 2023) කිහිපයක පුවත් සිරස්තල පහත දැක්වේ. මෙහි දී දිවයින සහ තිනකරන් පුවත්පත් වල සිරස්තලයන්, අත්අඩංගුවට පත් අයගෙන්, කාන්තාවක් පමණක් සෘණාත්මකව ඉස්මතු කර ඇත. නමුත් මෙම පුවත වාර්තා කළ ලංකාදීප, වීරකේසරී සහ දිනමිණ පුවත්පත් එසේ කාන්තාවන් හෝ පිරිමින් වෙන් වෙන්ව දක්වා නැත.

ඔබ සිතන ලෙසට,

1) එකම වරදක් සම්බන්ධයෙන් කාන්තාව පමණක් මාධ්‍ය විසින් ඉස්මතු කොට දැක්වීම ආචාර ධාර්මික මාධ්‍යකරණයට අනුකූල වීමක්ද?

2) ඒ අනුව, වඩාත් යෝග්‍ය වාර්තාකරණයන් ලෙසින් ඔබ තෝරාගන්නේ කුමන සිරස්තල ද?

**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.

*අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!